බ්‍රහ්මදත්ත රජතුමා බරණැස් නුවර රජකම් කරමින් සිටියේය.
එකල හිමාලය කඳු පාමුල තාපසයෝ පන්සිය දෙනෙක් වාසය කළහ.

මේ කාලයේ හිමාලයේ කඳු පාමුල ප්‍රදේශයට
දරුණු නියඟයක් පැමිණියේය.
බොහෝ කාලයක් වැසි නොවැස්සේය.
ගංගා ඇළ දොළ සිඳී ගියේය.
ළිංවල වතුර නොමැති විය.



(c) Sumitha Publishers

**තාපසයන්ට බොහෝ කරදර ඇති විය.**


(c) Sumitha Publishers

තාපසයන්ට පමණක් නොව
වනයේ සියලු සතුන්ට ද
වතුර නොමැතිකමින්
බොහෝ දුක් පීඩා සිදු විය.
සත්තු වතුර සොයමින්
තැන තැන ඇවිද ගියහ.

සතුන් අසරණ ව වතුර සොයමින් යන අන්දම
එක් තාපසයෙක් දුටුවේය.
සතුන් ගැන මහා කරුණාවක්
ඔහුගේ සිතේ ඇති විය.

(c) Sumitha Publishers

